**නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය - 2024**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කල මතය**

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ (''ආයතනය'') 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතව මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම් කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය,ගිණුම් කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත්සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 ඡේදය ප්‍රකාරව පිරිවැය රු.280,927,441 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපළ පිරියත උපකරණවල දළ ධාරන අගය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 92 ඡේදය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන ලද වත්කම්වල දළ ධාරන අගය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.19,137,133 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව වර්ෂයේ හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා නොගෙන හිමිකම් යටතේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණි. තවද, ඉකුත් වර්ෂවල | සංවර්ධන වියදම්වල සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රතිලාභය ආදායමක් ලෙස මූල්‍ය කාර්ය ප්‍රකාශනයට ඇතුළත් කොට ඊට සමගාමීව ක්‍රමක්ෂය වීම් ලෙස මූල්‍ය කාර්ය ප්‍රකාශනයෙන් අඩු කොට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11ට අනුකූලව කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව භාණ්ඩාගාර ප්‍රදාන ආදායම් ලෙස හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන ද ප්‍රමිතිය ප්‍රකාරව අදාළ වර්ෂවල ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ආරම්භ කළ පාඨමාලා 11කින් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම රු.4,314,191 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.5,065,000 ක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් රු.750,809 කින් ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම් හඳුනාගැනීමේ ආයතනික ප්‍රතිපත්තියට අනුකූලව 2023 වර්ෂයේ ආදායම විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර 2024 වර්ෂයේදී එය ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.139,704,380 ක් වූ ආයෝජන අතුරෙන් රු.33,696,000 ක ආයෝජනවලට අදාළ වූ රු.2,806,177ක් වූ පොලී ආදායම, ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ පොලී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාර බිල්පත්වල රු.17,115,565 ක් හා ස්ථාවර තැන්පතුවල රු.88,892,815 ක් වූ ආයෝජන සඳහා වන සමාලෝචිත වර්ෂයට අදාළ පොලී ආදායම රු.7,811,967 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.6,904,746 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා පොලී ආදායම රු.907,221 කින් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන සඳහා පොලී ආදායම නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 2(1) හා 102 වගන්ති | ආදායම් බදු සඳහා ලියාපදිංචිවීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපයන විට අගය මත බදු ලියා පදිංචි නිදහස් කර ඇති නිසා ආදායම් බදු සඳහා ලියා පදිංචි වීමට අවශ්‍ය නොවේ. | දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව බදු සඳහා ලියාපදිංචි වීමට හෝ නිදහස් කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මඟින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) | තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් ලබාදිය යුතු වුවත් අවස්ථා 11 කදී එකතුව රු.1,799,650 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන්ට ලබා දී තිබුණි . | තත්කාර්ය අතුරු අග්‍රිමයන් මාණ්ඩලික තත්ත්වයේ නිළධාරීන් සඳහා පමණක් ගෙවිය යුතු වුවත් සේවක පුරප්පාඩු හේතුවෙන් මාණ්ඩලික නොවන නිලධාරීන් හට නිකුත් කිරීමට සිදු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාණ්ඩලික නොවන නිලධාරීන්ට අතුරු අග්‍රිම ලබාදීම නීත්‍යානුකූල නොවන අතර කාර්යය මණ්ඩල පුරප්පාඩු පවතී නම් බඳවා ගැනීම් කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මඟින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා විශේෂිත අවස්ථාවලදී පාර්ලිමේන්තුව සම්මත කරන පනතකින් හැර වෙනත් කිසිඳු ආකාරයකින් නව අරමුදල් ඇති කිරීම සපුරා තහනම් බව දක්වා තිබුණද ආයතනය විසින් | විසර්ජන පනත මඟින් අනුමත කරන අය වැය වලට පරිබාහිරව ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම පිළිබඳ රාජ්‍ය මුදල් අමාතාංශයේ මූලිකත්වයෙන් රැස්වීම් මාලාවක් පවත්වා ඇත. එහිදී ඇතිවන එකඟතා හා තීරණ මත මෙම කරුණු පිළිබඳව | චක්‍රලේඛන හා මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව අරමුදල් පවත්වාගෙන යා යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ජනරජයේ මුදල් රෙගුලාසි 876 | පර්යේෂණ සංවර්ධන නව තාක්ෂණික නවෝත්පාදන දිරිගැන්වීම, තරකා විද්‍යාව අභ්‍යවකාශ යෙදවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන කටයුතු යන කාර්යයන් සඳහා පවත්වා ගෙන ගොස් තිබූ අරමුදල් හතරක වර්ෂය අවසානයට එකතුව රු.99,341,390 ක ශේෂයක් පැවතුණි. | පුළුල්ව සාකච්ඡා කර තීරණ ගැනීමක් ඉදිරියේදී සිදු කරනු ලැබේ. | |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනු කමිටුවට යොමු කිරීමට නියමිතය. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,043,866 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,438,410 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,394,544ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රදාන ආදායම රු.12,939,815 කින් වැඩිවීමට සාපේක්ෂව වෙනත් ආදායම් රු.16,147,996 කින් අඩුවීමත්, වැටුප් හා වියදම් රු. 17,441,824 කින් හා සැපයුම් සහ පාරිභෝජන සේවා රු.5,309,374 කින් වැඩිවී තිබීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද Tea quality Grading & colour separating system ව්‍යාපෘති සඳහා 2023 වර්ෂය වන විට එකතුව රු.13,171,672 ක් වියදම් කර තිබූ අතර 2023 ජනවාරි නිම කළ යුතු ව්‍යාපෘතිය 2025 අප්‍රේල් වන විටත් නිමකර නොතිබුණි. 2022 ජනවාරි 01 දින ආරම්භ කර තිබූ තාක්ෂණික පැවරීමේ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත එක් අරමුණක් වූ E - net Solutions (Pvt) Ltd මඟින් ආතර් සි ක්ලාක් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය වෙත EPGA තාක්ෂණ පැවරීම සම්පූර්ණ කර නොතිබිණි.එහි තවත් අරමුණක් වූ Tea Colour Sorting යන්ත්‍රය එළිදැක්වීම හා අලෙවිකරණය යන්නෙහි අවසාන අදියර සම්පූර්ණ කිරීමටද අපොහොසත් වී තිබුණි. | ව්‍යාපෘතිය සඳහා වන FPGA තාක්ෂණය පැවරීමේ කටයුතු නිම කරන ලදී. නිර්මාණය පිළිබඳ සියලුම කොටස් ආශ්‍රිත දැනුම ලබාගෙන අදාළ සියලුම තාක්ෂණික ලියකිවිලිද නිමකර ඇත. යන්ත්‍රයේ විස්තීරණ පරීක්ෂාවට අවශ්‍ය යන්ත්‍රය සූදානම් කිරීමේ කටයුතු හා නියැදි (Sample) මේ වන විට සූදානම් කර ඇති අතර 2025 ජූනි මාසයෙන් පසුව අවසාන අදියර සම්පූර්ණ වීමට නියමිතය. | රජයේ අරමුදල් වැය කරමින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ළඟා කරගත හැකිවන පරිදි කටයුතු සැලසුම් සහගතව ඉටු කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික කටයුතු වලදී දියර පොහොර ඉසීම පහසු කිරීම සඳහා ඩ්‍රෝන උපකරණයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වසරක් තුළ නිමකිරීමේ කාල රාමුවක් සහිතව 2022 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර 2023 වර්ෂය අවසානයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.1,000,000 ඉක්මවා යමින් රු 1,629,073.ක් වැය කර තිබුණු නමුත් අපේක්ෂිත නිමවුම කරා ළඟා වී නොතිබුණි. | දියර පොහොර ඉසීම පහසු කිරීම සඳහා නිපදවන ලද උපකරණයේ ගොඩබෑමේ ආම්පන්න Landing year) ආයතනය තුළ නිපදවන ලද 3D printing කොටස් දමා සිදු කරන ලදී. ඒවායේ ශක්තිය ප්‍රමාණවත් නොවන බව පුහුණු පියාසර වලදී නිරීක්ෂණය විය. මේ වන විට එම කොටස් පිටරට ආයතනයකින් කෙලින්ම මිලදී ගැනීමට හැකිද නැතිනම් නිර්මාණය කරගත හැකිද යන්න පිළිබඳ අධ්‍යයනය කරමින් පවතී . | රජයේ අරමුදල් වැය කරමින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ළඟා කරගත හැකිවන පරිදි කටයුතු සැලසුම් සහගතව ඉටු කිරීමට වගබලා ගත යුතුය. |
| (ඇ) | 2018 සැප්තැම්බර් 07 දින වන විට රු.1,375,400 ක වියදමක් දරා නිර්මාණය කරන ලද RFID Guest gate with Accessories සහ RFID Host Gate උපකරණයට අවශ්‍ය දත්ත | RF-ID තාක්ෂණය පදනම් කරගත් පුස්තකාල සේවාව ස්වයංක්‍රීය කරන පද්ධතිය පරීක්ෂා කිරීමේ කටයුතු දෘඩාංග පද්ධතිය සමඟ එකට කටයුතු කිරීමේ නොගැලපීම් | රජයේ අරමුදල් වැය කරමින් සිදුකරන ලද ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ළඟා කරගත හැකිවන පරිදි කටයුතු |

| | | | |
|---|---|---|---|
| | පද්ධතිය හා කළමනාකරණ පද්ධතිය විගණිත දිනය වූ 2025 අප්‍රේල් 22 තෙක්ම භාවිතයට ගත හැකි තත්ත්වයට ගොඩනගා ගෙන නොතිබුණි. | පැවතීම නිසා 2025 වසරේ ක්‍රියාකාරී සැලසුමේ ව්‍යාපෘතියන් ලෙස සම්පූර්ණ පුස්තකාල පද්ධතිය මෘදුකාංග හා දෘඩාංග හරහා ගොඩනැගීමට තීරණය කරන ලදි. | සැලසුම් සහගතව ඉටු කිරීමට වග බලා ගත යුතුය. |
| (ඊ) | ආයතනයේ ප්‍රධාන අරමුණු අතර නවීන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම ඇතුළත් වුවද එම කාර්යයට අදාළව 2020 - 2024 වර්ෂවල ප්‍රදර්ශන කටයුතු සඳහා සම්බන්ධ වීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ආයතනයේ තාක්ෂණික අරමුණු හා බැඳී. පවතින ප්‍රදර්ශන ලෙස ආයතනය ප්‍රමුඛත්වය ලබා දෙනුයේ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය න් වාර්ෂිකව පවත්වනඝිමTECNO සහ ජාතික විද්‍යා දිනයට සමගාමීව සංවිධානය කරනු ලබන විද්‍යා දින සැමරුම් ප්‍රදර්ශන වේ. වසර ගණනාවක සිට පවතින තාක්ෂණික හා මානව සම්පත් හිඟකම ප්‍රදර්ශනවලට සහභාගී වීමට බලපානු ලැබූ ප්‍රධාන දුෂ්කරතා විය. | නවීන තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා උපරිම මැදිහත්වීම් ආයතනය විසින් සිදුකළ යුතුය. |
| (උ) | 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට රු.936,271 ක් වැයකර Based Fixed Assets Verification පද්ධතියක් නිර්මාණය කර තිබුණද 2025 අප්‍රේල් වන විටත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය මඟින් ආයතන ගත ව්‍යාපෘති ලෙස සංවර්ධන කරන ලද ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු මේ වන විට නිමවා ඇත.මෙම පද්ධතිය පරීක්ෂා කිරීම සහ තහවුරු කිරීම තවදුරටත් ඉදිරියට කළ යුතු කාර්යන් වේ. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීමේ අරමුණින් ස්ථාපිත මෘදුකාංග පද්ධතිය නිමකර ප්‍රයෝජනයට ගනිමින් කාර්යයන් ඉටුකර ගත යුතුය. |
| (ඌ) | ආයතනයේ වර්ග මීටර 35 ක බිම් ප්‍රමාණයක් සන්නිවේදන උපකරණයක් සවිකිරීම සඳහා මොබිටෙල් පුද්ගලික සමාගම වෙත දිගුකාලයක සිට ගිවිසුම්ගතව ලබා දී තිබුණු අතර අදාළ ගිවිසුම 2023 මාර්තු මාසයෙන් පසු අවසන් වී ඇතත් 2025 අප්‍රේල් මස වන විටත් නව ගිවිසුමකට එළඹ නොතිබුණි. | නව ගිවිසුම අවසන් කෙටුම් පත් අවදියේ පසු වන අතර,එය නිම කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම් කල්පිරීමේදී නියමිත දිනට නව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. ගිවිසුමක් රහිත වත්කම් බදු නොදිය යුතුය. |
| (එ) | ආයතනයේ මූලික අරමුණ ලෙස දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණ හැකියාවන් දියුණු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය තුලින් නවෝත්පාදන මධ්‍යස්ථානයක් | මෙම සියලු ආයෝජන සිදුකරන ලද ව්‍යාපෘති පායමාලා හා උපදේශන සේවා තුළින් බිහිවූ අතිරික්තයන් ගෙන් සිදු වූ ආයෝජනයන් වේ. | ආයතනයේ පවතින අරමුදල් යොදවා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කර නවෝත්පාදන මඟින් |

| | | | |
|---|---|---|---|
| | බවට පත්වීම වුවත් එම අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි ප්‍රමුඛතාවය මත කටයුතු නොකර, සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ පවතින අරමුදල් රු.139,704,380 ක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි . | | නවීන තාක්ෂණ හැකියාව දියුණු කිරීමට කටයුතු කළ යුතු අතර ආයෝජනය කරන්නේ නම් භාණ්ඩාගාර අනුමැතිය මත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තය ලෙස රු.2,043,865 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද රු.228,712,899 ක් වූ සමස්ථ ආදායම තුළින් මෙහෙයුම් කටයුතුවලින් උපයාගෙන තිබුණේ රු.30,066,598 ක් පමණක් වූ අතර ඒ වෙනුවෙන් දරා තිබූ පරිපාලන, සැපයුම්, නඩත්තු, පර්යේෂණ සංවර්ධන හා ව්‍යාපෘති වියදම රු.220,908,875 ක් වීමෙන් මෙහෙයුම් කටයුතුවලින් රු.90,841,477 ක ඌනතාවයක් ලබා තිබුණි.තවද මෙකී මුළු වියදමෙන් ව්‍යාපෘති වියදම් සහ පර්යේෂණ හා සංවර්ධන වියදම් වශයෙන් රු.12,290,261 ක් එනම්, සියයට 6 ක ප්‍රතිශතයක් පමණක් වැයකර තිබුණි. | අප ආයතනය ප්‍රධාන වශයෙන් රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරන, රටේ පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සඳහා පෞද්ගලික අංශය ඉදිරිපත් නොවන, ජාතික සහ සමාජීය අවශ්‍යතා සඳහාද ඉදිරිපත් වීම් සිදුකර ඵලදායී විසඳුම් ලබාදෙන ආයතනයකි. එම නිසා මූල්‍යමය වශයෙන් පමණක් පදනම් කරගෙන තක්සේරුකර නිගමනයකට පැමිණීම උචිත නොවේ. සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වලින් ඉපයූ ආදායමට සාපේක්ෂව පාඨමාලා ව්‍යාපෘති හා උපදේශන සේවා වලින් ලබාදුන් දායකත්වයට වඩා වැඩි දායකත්වයක් 2025 දී වර්ධනය කර ගැනීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙහෙයුම් කටයුතුවලින් ආදායම් උපයා ගැනීමට හා ආයතනයේ සාර්ථක පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකර නවීන තාක්ෂණය වැඩිදියුණු කරගැනිමට කටයුතු කළ යුතුය. ඒ සඳහා නිසිමඟ පෙන්වීමක් ආයතනික වශයෙන් සිදු කළ යුතුය. |
| (ක) | සන්නිවේදන අංශය වෙත රු.9,500,000 ක වියදමක් දරා ඉලෙක්ට්‍රොනික් උපකරණ ලබාගෙන තිබුණද කාලීන අවශ්‍යතාවයන්වලට අනුව සැලසුම් කරන ලද ඉලෙක්ට්‍රොනික් පුහුණු වැඩසටහන් කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි. | විශ්ව විද්‍යාල සමඟ සහයෝගයෙන් තාරකා විද්‍යා පර්යේෂණ සිදු කරන අතර මෙම පර්යේෂණ වලට අමතරව ළමුන් සඳහා තාරකා විද්‍යා වැඩමුළු පැවැත්වීම සහ ආයතනය අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම ඇතුළත් වේ රට තුළ තාරකා විද්‍යා විෂය පුළුල් කිරීම අරමුණු කරගත් විධිමත් යෝජනා රැසක් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනා අතරට ජාතික නිරීක්ෂණාගාරයක් පිහිටුවීම ද ඇතුළත් වේ. | කාලීන අවශ්‍යතාවයන් වලට අනුව සැලසුම් කරන ලද ඉලෙක්ට්‍රොනික් පුහුණු වැඩසටහන් සාර්ථකව ඉටු කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ට) | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කළ යුතු එක් එක් උප ව්‍යාපෘති 8 ක් වර්ෂය | ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධනය සියයට 10 සිට සියයට 83 දක්වා පරාසයක පැවතීමට හේතු | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා සැලසුම් සිදුකළ යුතු අතර |

| | | |
|---|---|---|
| තුළදී ක්‍රියාත්මක කර නොතිබුණ අතර ක්‍රියාත්මක කළ උප ව්‍යාපෘති 19ක කාර්යසාධනය සියයට 10 යේ සිට 83 දක්වා පරාසයක පැවතුණි. | ලෙස අදාළ ව්‍යාපෘතිවල කටයුතු කරන ඉංජිනේරුවරුන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලවල සාමාජිකයන් ඉවත්ව යාම නිසා රඳවා ගැනීම ආයතනයේ දීර්ඝ කාලයක සිට මුහුණ දෙන ගැටලුවකි. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධනය ඉහළ සාර්ථකත්වයකින් ළඟා කර ගත යුතුය. |

3.2 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් 2016 හා 2018 වර්ෂවල මිලදී ගත් රු.11,940,077 ක් වටිනා යන්ත්‍ර උපකරණ 03ක් මිලදී ගත් දින සිටම ප්‍රයෝජනයට නොගෙන පුස්තකාලය හා සන්නිවේදන අංශය තුළ නිෂ්කාර්යව තබා තිබුණු අතර කර්මාන්ත සේවා අංශයේ ISD පද්ධතිය ක්‍රියාකාරීව පැවතීමට අවශ්‍ය රු17,348,222 ක් වටිනා උපාංග වසර 05 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි . | පුහුණුව ලත් නිලධාරීන් දෙදෙනෙකු යටතේ මෙම යන්ත්‍රය වර්ණ ගැන්වීමේ කටයුතු (DYEING) සඳහා සහ පුහුණු කිරීමේ කටයුතු සඳහා යොදා ගනී. එමෙන්ම මොරටුව විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා මෙම යන්ත්‍රය ප්‍රයෝජනයට ලබා දේ. | අරමුදල් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කර යන්ත්‍ර නිෂ්කාර්යව පැවතීම වළක්වා ගත යුතුය. |
| (ආ) | පුරා විද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් කටයුතු සඳහා ඡායාරූප ලබාගැනීමේ අරමුණින් 2016වර්ෂයේ දී රු.10,564,677ක් වූ නියමුවන් රහිත ගුවන් යානයක් මිලදී ගෙන එය ක්‍රියාත්මක කිරීමට රු.110,320ක් වැයකර අවශ්‍ය පුහුණුව හා පියාසර කිරීමට අවශ්‍ය අවසරය ලබාගෙන තිබුණද මිලදී ගත් දින සිට විගණිත දිනය වන 2025 අප්‍රේල් 22 වන විටත් අදාළ කාර්යය සඳහා යොදා නොගැනීම හේතුවෙන් වැය වූ රු.10,674,999 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට වසර හයකට (06) වැඩි කාලයක් ගත වුවද මෙම උන්නතාංශ සීමාව සංශෝධනය කිරීමට නොහැකි විය. 400 ක් දක්වා UAV මෙහෙයුම් සඳහා අවසර දෙන නව CAASL රෙගුලාසි පිළිබඳව දැනුම් දෙනු ලැබුවේ 2022 නොවැම්බර් මාසයේදීය. මෙම කාලය වන විට UAV ව්‍යාපෘතිවල භාවිතා කිරීමට තිබූ අවස්ථාවන් අහිමි වී තිබූ අතර ආර්ථික සහ සමාජමය වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාවන්ද මග හැරී තිබුණි. යාවත්කාලීන කරන ලද උන්නතාංශය සීමාව යටතේ නැවත ආරම්භ කිරීමේ දී ගුවන් යානයේ පියාසර සැලසුම් පද්ධතියේ තීරණාත්මක මෘදුකාංග දෝෂයක් ඇති විය. ශ්‍රී ලංකාවේ | මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් දරා ගන්න අවුරුදු නවයකට වැඩි කාලයක් ගතවී ඇතත් අවශ්‍ය අරමුණු ඉටුකර ගැනීමට තවදුරටත් කටයුතු කළ යුතුය. |

මුල් සැපයුම්කරු වන Orel Pvt Ltd වෙතින් වාචිකව සහ ලිඛිතව සහාය ඉල්ලා සිටි නමුත් තවමත් විසඳුමක් ලබාදීමට අපොහොසත් වී ඇත.

## 3.3 මානව සම්පත්කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය 177ක් වන අතර පුරප්පාඩු සංඛ්‍යාව 93 ක් එනම් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 54 ක් විය. පුරප්පාඩු සංඛ්‍යාවෙන් 47ක් එනම් සියයට 50 ක් ආයතනයේ ප්‍රධාන කාර්යය වන නවීන තාක්ෂණය හඳුන්වා දීම වේගවත් කිරීම සහ අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම යන කාර්යයන්ට ඍජුවම දායක වන තාක්ෂණික ගණයේ පුරප්පාඩු විය . | සමස්ත අනුමත කාර්ය මණ්ඩලය සියයට 54 ක ප්‍රමාණයක් පුරප්පාඩුව පවතී .විවිධ හේතු මත, එසේ බඳවා ගත් තාක්ෂණික කාර්ය මණ්ඩලවල ඉංජිනේරුවන්, විද්‍යාඥයින් සහ තාක්ෂණ ශිල්පින් ඉල්ලා අස් වූ අතර ඇතැම් ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරින් විශ්‍රාම වයසට පැමිණීම මත විශ්‍රාම යන ලද බව. | ආයතනයේ කටයුතු බාධාවකින් තොර පවත්වාගෙන යාමට හැකිවන පරිදි කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |